

# අකුණු වෙන කුණු



ලක්ෂ්මන් කොඩිතුවක්කු

අද අප රටේ කුණු ප්‍රශ්නය ඕජස් ගලන තුවාලයක් තරමටම වන වෙලාය. මහා මන්දිර, වරයාවල්, ගුවන් තොටුපලවල් ජාත්‍යන්තර මට්ටමින් ඉදිවන රටක, නීතියද කුණු වී ගඳ ගහන රටක කුණු විනාශ කර ගැනීමට අවශ්‍ය යන්ත්‍රාගාරයක් ඉදිකර ගැනීමට තරම්වත් වත්කමක් නොමැතිව කුණු අකුණු මෙන් හඬ තලයි. ආර් ප්‍රේමදාස අගමැතිවරයාව සිටි සමයේ ආරම්භ කළ ගම් උදාව ව්‍යාපෘතියත් සමගම කොළම අවට පහත් බිම් හා කුඹුරු ගොඩවීම ආරම්භ වූ බව අප කාටවත් රහසක් නොවේ. "යට කළ මහා වගුරු බිමකි. එහි නැඟ එන නව නුවරකි" යන ප්‍රචාරක පාඨය අපට ඒ දවස්වල නිතරම වාගේ මාධ්‍යය තුළින් සවනට වැටුණේ ඔහුගේ මේ නිවාස ව්‍යාපෘති නිසාය. මාළිගාවත්ත ප්‍රදේශයේ විශාල වගුරු බිම් ගොඩ කළ අගමැතිවරයා මහල් නිවාස මෙන්ම ජාත්‍යන්තර ක්‍රිකට් පිටියක්ද, රටට දායාද කළේ ඔහුගේ ජනාධිපති ඉලක්කය සපුරා ගැනීමටය. එලෙසම ඒ තුළින් බොහෝ නිවාස නැති ජනතාවට මොනයම් ක්‍රමයකට හෝ නිවාස ලැබීම පිළිබඳවද අපිට අමතක කළ නොහැක. එහෙත් කොළඹට එකතු වන කුණු පිළිබඳව ඔහු නොසිතුවේ ක්‍රීඩා පිටියක්, ගෙයක් මෙන් කුණු මාකට් කළ නොහැකි නිසාය.

කොළඹ නගරය ජනාකීර්ණ වීමත් ක්‍රම ක්‍රමයෙන් ජනගහනය වැඩිවීමත් සමඟ, අගමැතිවරයා එම කුණු කන්ද බ්ලූමැන්ඩල් සිට මීතොටමුල්ලට පටවන්නට තීරණය කළේ එවකට සිටි ඔහුගේම ගෝලබාල ඇමතිවරයෙකු වූ කොළොන්නාව මන්ත්‍රීවරයාව සිටි වීරසිංහ මල්ලිමාරච්චිගේද සුභාසිංසන මැද්දේය. අක්කර විස්සක පමණ පහත් බිම් ප්‍රදේශයක අගනා කුඹුරු යායක් යටකර ගෙන බිහිවූ මීතොටමුල්ල කුණු කන්ද ආරම්භ වූයේ බ්ලූමැන්ඩල් කුණු කන්දට ඒ කුණු බර දරා ගැනීමට නොහැකි නිසාය. මීතොටමුල්ල ප්‍රදේශය අවට දුගඳ පතුරවමින් ආරම්භ වූ එම කුණු කන්දට දිනකට කුණු ටොන් දාහකට කිට්ටු ප්‍රමාණයක් ළඟා වෙන බව එහි අවට වෙසෙන ජනතාව පවසති. එහෙත් මෙම කුණු කන්ද ක්‍රමයෙන් ඉහළට නගින විට ඒ අවට පැල්පත්වාසී ජනතාව කිසි දිනෙක මෙය පිදුරුතලාගල කන්ද මෙන් උසයන බව නම් නොසිතන්නට ඇත. සමහර පැල්පත් වාසීන්ට මෙය එදා වේල හම්බකරන් කන ආදායම් මාර්ගයක් විය. ඔවුහු එහි ඇති කඩදාසි කැබලි, පරණ යකඩ, ප්ලාස්ටික් ආදිය එකතු කර පරණ බඩු කඩවල් වලට විකුණා තම ඉහළ යන ජීවන වියදම පාලනය කර ගැනීමට විශාල ප්‍රයත්නයක් දැරූහ. එහෙත්, මෙම කන්දෙන් පැතිරෙන විෂ බීජ තුළින් රෝගී වන තම දරුවන් හා තමන් පිළිබඳව ඔවුන් සිතන්නට පෙළඹුනේ එහි අයහපත් ප්‍රතඵල තම දෑසටම දකින්නට වරම් හිමි වූ නිසාය.

කුෂ්ඨ රෝග, ස්වසන රෝග, චර්ම රෝග ආදී දහසක් රෝගවලින් පීඩා විඳින ඒ අවට ජනයා පිළිබඳව සිතන්නට අද ඒ පළාතට මන්ත්‍රීවරයෙක් ද නැත. සිටිනා කළද ඔහු කුණු කන්ද සේම අවට ජනයා කෙතරම් කුණු වුනත් බදාගෙන ආදරය කළේ තම ඡන්ද ගොඩ වැඩි කර ගැනීමටය. තමිල්නාඩුවත්ත තමන්ගේම ප්‍රදේශයක් කර ගනිමින්, කොළොන්නාව ආසනය පාලනය කළ දුමින්ද සිල්වා ද වෙඩි වැදීමට පෙර මීතොටමුල්ලට අඩිය තිබ්බේ නාසය වසාගෙනය. කුණු තරම්ම රස ඡන්ද ගොඩක් ඇති ඒ ප්‍රදේශයෙන් ඔහුට විශාල සහයෝගයක් ලැබුණේ මේ කුණු ප්‍රශ්නයට ද ඔහුගෙන් විසඳුමක් බලාපොරොත්තුවෙනි. එහෙත්, ඔහු අඩපණ වූයේ මුළු කොළොන්නාව ආසනයම කුණුගොඩක් කරමිනි. එසේම අද ඒ ප්‍රදේශයේ ජනතාව සමඟ එකතු ව පිකටින්, සත්‍යග්‍රහ ව්‍යාපාර කරන පෙරටුගාමී පක්ෂයේ උදුල් ප්‍රේමරත්නලාද තරමක් වාසනාවන්ත බව කිව යුතුමය. දුමින්ද සිටියා නම්, ඔවුන්ට අද ප්‍රදේශයේ යහතින් උද්ඝෝෂණ කරන්නට ලැබෙන්නේ නැත. කුණු ප්‍රශ්නය විසඳනු වෙනුවට දුමින්දගේ මැරයන්ගේ ප්‍රහාරවලින් උදුල්ලාව කුණු වෙන්නට තිබිණි.

රටක ප්‍රධාන නගරයක ජීවත්වන ජනතාවගේ සියළුම කුණු තවත් නගරයකට එකතු කර ගඳ ගැස්සවීම ඒ ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට කරන ලොකු අසාධාරණයකි. සත්ව මළකුණු, අසූචි ගොඩවල් පවා ඇදී එන මෙම කුණු කන්ද තාවකාලිකව පස්වලින් වසා ගඳ අඩුකිරීමට පාලකයන් උත්සහ කළත් එය තාවකාලික පිළියමක් බවට පත්වන්නේ ඊට ඉහළින් දිනපතාම තවත් කුණු එකතු වන නිසාය. අපි ශ්‍රී ලංකාව, ඕස්ට්‍රේලියාව වැනි රටකට සම කරන්නට උත්සහ දරන්නේ නැත. එහෙත් මෙවැනි රටක කුණු කළමණාකාරණ පද්ධතිය ආදර්ශයට ගෙන එයට ආසන්නයෙන්වත් මෙම කුණු ප්‍රශ්නය විසඳීමට රජයට හැකියාවක් තිබිය යුතුය.

කුණු හා ඉවත ලද වෙනත් දෑ ප්‍රතිචක්‍රියකරණය කිරීම තුළින් පරිසර හිතකාමී රටක් ගොඩනඟන්නට අපට දැන් හැකියාවක් තිබිය යුතුය. යකඩ, කඩදාසි, ප්ලාස්ටික් වැනි දෑ නැවත ප්‍රතිචක්‍රියකරණය කරන ඕස්ට්‍රේලියාව වැනි රටවල් පරිසර දූෂණ අවම කරන්නේ එයින් නැවත නැවතත් භාණ්ඩ නිපදවා ආදායමක්ද උපදවා ගනිමිනි. මෙහි වෙසෙන ජනතාව කුණු එකතු කරන්නට නගර සභාවට බදු මුදල් ගෙවන්නේ කිසිම විවේචනයක් නොමැතිවය. මන්ද එම මුදල් වලින් අනගි සේවයක් රටට ජනතාවට සිදුවන නිසාය. එහෙත්, අප රටේ ජනතාවට බදු මුදල් ගෙවීමට වත්කමක් නැත. ගෙවන්නට ඇති හැකි එකාද මගඩි ගසමින් ඒවායින් මඟහැර වරිපනම් වලින් පවා මුදල් වංචා කරන්නේ තමන්ගේ කුණුවන ශරීරය ගැනවත් නොසිතාය. එහෙයින්, අප වැනි රටක මෙයට සෘජුවම රජය මැදිහත් විය යුතුය. පෞද්ගලික සමාගම් වලට කුණු එකතු කරන්නට දී මුදල් වංචා කරන කෝටිපතියන් බිහිකරනවාට වඩා රජයෙන් මෙම කුණු ප්‍රශ්නයට දෙන විසඳුම දෙස ජනතාව දෑස් විවර කරගෙන බලා සිටින්නේ එහෙයිනි.

පසුගිය එ.ජා.ප. රජය විසින් විනාශ කළ විදේශිය පරිත්‍යාගයක් වූ ඇඹිලිපිටිය කඩදාසි කම්හල, මළකඩ කමින් දිරාපත් වන විට, රාජපක්ෂ රජයේ ඇමතිවරයෙකු ඕස්ට්‍රේලියානු සමාගමකට එය අඩු මුදලකට විකුණා දැමුවේය. ඒ එක් අරමුණක් ඇතිවය. එනම් මුළු රටේම අපද්‍රව්‍යයක් ලෙස එකතුවෙන අබල කඩදාසි එකතු කර නැවත ප්‍රතිචක්‍රීකරණය කොට ලාංකික වෙළඳපොළ වෙනුවෙන් අළුත් කඩදාසි නිපදවීමටය. ලංකාවේ එම ව්‍යාපෘතිය භාරව කටයුතු කළේ, මෙරට සිට ලංකාවට ගිය අපේම ශ්‍රී ලාංකික ඉංජිනේරුවරයෙකි. ඔහු ඕස්ට්‍රේලියාවේ සිට ලංකාවට ගොස් කඩදාසි කම්හලේ වැඩ නැවත පටන් ගන්නා බවට මාධ්‍යවලටද ප්‍රකාශ නිකුත් කළේය. එහෙත් අන්තිමට සිදුවූයේ වෙනකකි. ඔවුහු සියල්ලෝම එකතු වී මළකඩ කෑ කඩදාසි කම්හල අමුතු ලෙසකට ප්‍රතිචක්‍රියකරණය කළහ. එහි වටිනා

## කුට්ටම් පොකුණ



යන්ත්‍ර සූත්‍ර ගලවා පරණ යකඩවලට විකුණා විශාල මුදලක් හිමි කරගත් එම නිළධාරීන් රටේ ජනතාවගේ ඇස් වසා රටින් පිටවූයේ කාටත් හොරෙනි. අවසානයේ එම ප්‍රවෘත්තිය මාධ්‍යයට නිකුත් වනවිට කඩදාසි කම්හල කඩදාසියක් තරමටම "රී සයිකල්" වී හමාරය. එහි ප්‍රධාන ආරක්ෂක නිළධාරී තනතුර දැරූ හමුදාවෙන් විශ්‍රාම ගිය මේජර්වරයා ඇතුළු පිරිස කෝටිපතියන් වූවත් එය කෙලෙස සිදුවූයේද යන්න රටේ ජනතාවට අදත් රහසකි.

නිසි කළමණාකරණයක් හා පැහැදිලි සැලැස්මක් නැති අප රටේ කුණු ප්‍රශ්නය ඔඩු දුවා ඇත්තේ මේ ආකාරයටය. ඡන්ද කාලය ළංවන විට දහසක් පොරොන්දු දෙන දේශපාලකයන්ට රැවටී ඇති මීතොටමුල්ල ජනතාවට අන්තිමට සිදුවූයේ පොලීසියෙන් බැට කන්නටය. එක අතකින් නාසය වසාගෙන අනෙක් අතින් අකුරු කරන දරුවන්ට පාසැලක් අහිමි වීම හා දුප්පත් ජනයාට අසාධාරණයක් සිදුවීම පිළිබඳව, දරුවන්ට ආදරය කරන ජනාධිපතිවරයාගේ දෙනෙත් මේ කුණු ප්‍රශ්නය වෙනුවෙන් යොමු විය යුතුය.

රටේ ජනතාවට පමණක් නොව සංචාරක ව්‍යාපාරය හා බැඳෙන මේ කුණු ප්‍රශ්නයට රජය මැදිහත් වී කිඩිනම් පියවරක් ගත යුතුය. රටක සංවර්ධනයට මහා කුණු කළමණාකරණයක් ද අවශ්‍යය. රටක් පිරිසිදු නොවේ නම්, එහි ජනතාවට ද සිදුවන්නේ අපිරිසිදුව මානසික රොගීන් මෙන් ජීවත්වන්නටය. සදාචාරාත්මක යහපත් මිනිසුන් බිහිකරන්නට යහපත් පරිසරයක්ද තිබිය යුතුය. සංචාරක ව්‍යාපාරය ගැන නිතරම අවධානය යොමුකරන ඒ ගැන පුන පුනා දොඩවන රජයක් මේ පිළිබඳව තදින් සිතිය යුතුය. නැත්නම් සිදුවන්නේ, ආණ්ඩුව සමඟින් ඒ ආණ්ඩුව පත් කළ ජනතාවටද එකටම කුණු වී මියදෙන්නටය.


Splendid Solutions

**Accounting & Bookkeeping Specialist**

- Software Installation and training
- Bookkeeping services for all business entities
- Payroll services
- Tailored accounting solutions
- Financial and management reporting
- Cash Flow, Budgeting, Variance analysis
- Business Activity Statements (BAS)
- Servicing all areas



Suresh Perera *B.Bus (Acc.), MAFM*

155 Shaws Rd Werribee VIC 3030

M: 0422 027 042

www.splendidsolutions.com.au

sperera@splendidsolutions.com.au